ගණුදෙනු වාර්තා තැබීම

ගණුදෙනු වාර්තා තැබීම

- **මුදලින් මැනිය හැකි ව්‍යාපාරික ගණුදෙනු ක්‍රමානුකූලව වාර්තා කිරීමයි.**

මෙහිදී ප්‍රධාන කාර්යයන් සිදුවේ.

01. තොරතුරු රැස් කිරීම.
02. මූලික ගිණුම් පොත් වල සටහන් කිරීම.
03. ද්විතික පොත් වල සටහන් කිරීම.
04. සාරාංශ කිරීම.

ගණුදෙනුවක් යනු

සම්පත් වල ප්‍රමාණයේ හෝ වගකීම් වල ප්‍රමාණයේ හෝ වටිනාකමේ ඇතිවන වෙනස් වීම් වලට සම්බන්ධ ආර්ථික කටයුතුය.

<u>සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක සිදුවන ගණුදෙනු වර්ග</u>

1. අයිතිකරු ප්‍රාග්ධනය යෙදවීම.
2. ස්ථාවර වත්කම් මිලට ගැනීම.
3. අත්පිට මුදලට භාණ්ඩ විකිණීම.
4. ණයට භාණ්ඩ විකිණීම.
5. වැටුප්, ගොඩනැගිලි කුලී ගෙවීම.

ව්‍යාපාරයක ගණුදෙනු සිදුවිය හැකි ආකාරයන්.

- මුදලට
- චෙක්පත්වලට
- ණයට

ගණුදෙනු වාර්තා කිරීමේ වැදගත්කම

- වයාපාරයට යෙදවූ ප්‍රාග්ධනයේ ප්‍රතිලාභ දැන ගැනීමට.
- බාහිර වගකීම් පියවීමේ හැකියාව තීරණය කිරීමට.
- ව්‍යාපාරයේ කළමනාකරුවන්ගේ කාර්යක්ෂමතාවය මැනීමට.
- ව්‍යාපාරය පිළිබඳ අනාගතයේ දී ගත හැකි ක්‍රියාමාර්ග තීරණය කිරීමට.
- වෙළඳපලේ තමාට හිමි ස්ථානය දැනගැනීමට.

ගිණුම් තැබීමට පෙර මේ ගැන සිතන්න.

- අයිතිකරු හා ව්‍යාපාරය යනු දෙදෙනෙකි.
- මුදලින් මැනිය හැකි ගණුදෙනු පමණක් සටහන් කිරීම.
- ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යනබව
- ව්‍යාපාරයේ ලාභය හෝ පාඩුව සොයන කාලය තීරණය කළ යුතුය.

ගිණුම්කරණ ක්‍රියාවලියේ දී අවධානය යොමු කල යුතු ගිණුම්කරණ සංකල්ප

1. **ව්‍යාපාර ඒකක සංකල්පය.**

සෑම ව්‍යාපාරයකටම එම ව්‍යාපාරයේ අයිතිකරුවන්ගෙන් සහ බාහිර පාර්ශවයන්ගෙන් වෙන්වූ ස්වාධීන පැවැත්මක් ඇත.

උදා - අයිතිකරුගේ පුද්ගලික ණය ව්‍යාපාරයේ වගකීමක් ලෙස නොසැලකීම.

2.මූල්‍ය මිනුම් සංකල්පය.

ගිණුම්කරණයේ දී සැලකිල්ලට ගනු ලබන්නේ මුදලින් මැනිය හැකි ගණුදෙනු පමණි.

උදා - සේවක දක්ෂතා පොත්වල නොපෙන්වීම.

3. අඛන්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය.

ප්‍රතිවිරුද්ධ සාධක වල බලපෑම් වලින් තොරනම් ඕනෑම ව්‍යාපාරයක් අවිනිශ්චිත වූ අනාගත කාලයක් දක්වා පවතින වග.

උදා- වත්කම් හා වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කිරීම

4. කාලච්ඡේද සංකල්පය.

අවිනිශ්චිත වූ අනාගත කාලය කුඩා කාලච්ඡේද වලට බෙදා එම කාලච්ඡේද වලට අදාලව ගිණුම් වාර්ථා සැකසිය යුතුය.

උදා- ආදායම් හා වියදම් කාලයට අනුකූලව හදුනා ගැනීම.

05.උපචිත සංකල්පය.

ගිණුම්කරණයේ දී ආදායම් හා වියදම් හඳුනා ගනු ලබන්නේ මුදල් පදනමට නොව කාල පදනම අනුවයි.

උදා- උපචිත වියදම් ගැලපීම.

06. උපලබ්ධි සංකල්පය

ආදායම් උපයන අවස්ථාව පිළිබදව මඟපෙන්වීමක් ලබාදීම.

උදා- සේවා විකිණීම සේවාව සැපයූ අවස්ථාව

07.ගැලපුම් සංකල්පය

ආදායම ආදායම ඉපයීමට දායක වූ වියදම සමඟ සැසැදිය යුතුය.

උදා- උපචිත වියදම් ගැලපිම.

08. විචක්ෂණ සංකල්පය

අලාභයක් නම් කල්තියා හදුනාගත යුතු අතර ලාභ උපයන තෙක්ම සිටිය යුතුය.

උදා- සේවක වන්දි සදහා යොමු කල යුතුය.

ගණුදෙනු වර්ග

1. ප්‍රාග්ධනය

   උදා- අයිතිකරු ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට ලක්ෂ 2 ක මුදලක් යෙදවීම.

2. ආදායම්

   උදා- භාණ්ඩ විකුණුම්

3. වියදම්

   උදා- ගොඩනැගිලි කුලී ගෙවීම

4. වත්කම්

   උදා- යන්ත්‍රයක් මිලදී ගැනීම.

5. වගකීම්

   උදා- බැංකු ණයක් ලබා ගැනීම

ව්‍යාපාරයක ගණුදෙනු තබන ආකාරය

- මුලින්ම මූලික ලියකියවිලි සකස් කරන්න.
- දෙවනුව ඒ ආශ්‍රයෙන් වාර්තා පෙතෙහි සටහන් කරන්න.
- තෙවනුව ඒ ආශ්‍රයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කරන්න.